# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 මාර්තු මස 20 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.39 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**●පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්. කුහවර්දන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කිත්සිරි මංචනායක
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගුණසිරි ජයනාත්
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නව්සර් ෆව්සි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පංචරත්නම් රාම්
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඩුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවි විජේසේකර
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් වර්ණකුමාර
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

**ගරු මන්ත්‍රීවරු**

අසෝක රන්වල
අමල් සිල්වා
ඈ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
කාමල් කුරුප්පු
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් පී. විතාන
නිමල් ආර්. පීරිස්
නිරෝෂන් පාදුක්ක
මල්ෂා කුමාරණතුංග මැතිනිය
යූ.එල්.එන්.පී. උඩවෙල
රොජර් සෙනෙවිරත්න
ලයනල් ජයසිංහ
ලලිත් එල්ලාවල
ලෙනාඩ් කරුණාරත්න
විජිත් ප්‍රියන්ත
සුනිල් වටගල
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම

## 01. අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා දීම් / දිවුරුම් දීම්

*"එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා 2017.12.15 දින සිට මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන්, ඊට අනුප්‍රාප්තිකව පත් වූ ස්ටැන්ලි ඇන්තනී සන්මුගම් ගරු මන්ත්‍රීතුමා ද ඉල්ලා අස්වීමත් හේතු කොටගෙන නැවත එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා [කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය] පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත් වී ඇති බවත්, ඒ අනුව එස්. කුහවරදන් ගරු මන්ත්‍රීතුමා 2018.03.14 වන දින තමන් ඉදිරියේ නිල ප්‍රතිඥාව / දිවුරුම් දීම සිදු කරනු ලැබූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. සභාපතිවරයාගේ නිවේදනය :

*i*

*"සභා ලේකම් - හේමන්ත සමරකෝන් මහතා නිවාඩු ලබා ඇති හෙයින් එතුමා නැවත සේවයට පැමිණෙන තෙක් එම්.ජී.ඒ. තිලකරත්න මහතා 2018.03.11 දින සිට සභා ලේකම් තනතුරේ වැඩ බැලීමේ කටයුතු සිදු කරන බවත්, එතුමා අද දින සභා ලේකම් අසුනේ අසුන්ගෙන සිටින බවත් ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී."*[1]

## 03. කාරක සභා වාර්තා :

2018.03.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් පිළිගන්වන ලදී.

## 04. නොපැමිණ සිටීමේ අවසරය :

*"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා විසින්ද,*

*ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ද ඉදිරිපත් කරන ලද යෝජනාවන් සභා සම්මත විය."*

## 05. පළාත් සභාවේ කටයුතු I :

සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක (01) හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 52(5), 57(1), 57(4) හා 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය."*

## 06. පළාත් සභාවේ කටයුතු II :

සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

[1] 2018.03.20 වන දින නිල වාර්තාව බලන්න.

## 07. පොදු කටයුතු : 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01

*ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.*

*"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශවල අවශ්‍යතා වෙනුවෙන් අමතර ප්‍රතිපාදන සලසා දීම සඳහා 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් හා ඒ සඳහා අවශ්‍ය රුපියල් තුන් බිලියන තිස්පස් මිලියන පනස් පන් දහසක් (රු. 3,035,055,000/-) වන මුළු ප්‍රතිපාදනය දැනට භාණ්ඩාගාර රිපෝ යටතේ ආයෝජනය කර ඇති මුදලින් කොටසක් ලබා ගැනීම මගින් පියවා ගැනීමට ද අපේක්ෂිතව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01[2] අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.14 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***අ.භා. 12.38 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

## 08. රීති අංක 30 යටතේ යෝජනාව :

*"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තෙක් මෙම සභාවේ කාලය දීර්ඝ කළ යුතුය."* ***යනුවෙන්*** සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

[**2018** පරිපූරක ඇස්තමේන්තුව **- 01** ට අදාළව ]

***අනතුරුව, මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරන ලදී.***

***"අද දින පළාත් සභා න්‍යාය පත්‍රය සමග ඉදිරිපත් කර ඇති පරිපූරක ඇස්තමේන්තුව සඳහා අතුරු යෝජනාවක් වශයෙන් පරිපූරක ඇස්තමේන්තුවේ දක්වා ඇති රුපියල් මිලියන 3035/- ක ප්‍රතිපාදනවලට අමතරව රුපියල් මිලියන 750 ක අමතර මුදලක් පරිපූරක ඇස්තමේන්තුවට අමතරව එකතු කර සම්මත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්, එම ප්‍රතිපාදන සඳහා අමතර යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙමින් එම අමතර ප්‍රතිපාදන අනුමත කර දෙන ලෙසත් යෝජනා කරන අතර, ඒ අනුව අවශ්‍ය කටයුතු කර දෙන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි."***

***2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට සංශෝධනයක් ඉදිරිපත් කරමින් මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනයෙන් නිර්දේශිත අමතර රුපියල් මිලියන 750 සඳහා යළිත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බවත්, එය අද දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා බවත්, ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් එවලේ ප්‍රකාශ කරන ලදී.***

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදුව, ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

---

[2] 2018.03.20 වන දින නිල වාර්තාව බලන්න.

## 09. **2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය**

*ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2018 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය සංශෝධිතාකාරයෙන් ඉදිරිපත් කරන ලදුව, සභා සම්මත විය.*

## 10. **අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2017 වර්ෂය :**

*ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.*

*"අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2017 නැමැත් උපලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේදී, 2016 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින් ද, එම උපලේඛනයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි."*

## 11. **නව කාර්ය පටිපාටි රීති :**

සුමිත් ලාල් මැන්දිස් සභා කටයුතු ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2018 මාර්තු මස 20 වන දින එනම් අද දින, 2018 ජනවාරි මස 09 වන දින නිල වාර්තාව සමග ඇමුණුමක් ලෙස සභාගත කරනු ලබන - 1997 ඔක්තෝබර් 09 වන දින බලාත්මක වූ රීති මාලා පුස්තකයට ඉදිරිපත් කරන ලද සියලුම සංශෝධනයන් ඇතුළත්ව 2017 නොවැම්බර් මස 07 වන දින සභාවට ඉදිරිපත් කොට, 2017 නොවැම්බර් මස 14 වන දින සහ 2018 ජනවාරි මස 09 වන දින සාකච්ඡා කොට 2018 ජනවාරි මස 19 වන දින සභා සම්මත වූ නව කාර්ය පටිපාටි රීති මාලා පුස්තකයේ ඇතුළත් මෙම සියලු රීතීන් 2018 මැයි මස 08 වන දින සිට බලපැවැත්විය යුතුය."*

## 12. **කල් තැබීම :**

ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 01.41 ට, 2018 අප්‍රේල් මස 03 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

එම්.ජී.ඒ. තිලකරත්න,
ලේකම් (වැ.බ),
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.03.21
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/21
Minuts 2018.03.20 - Hansard Sectionr